# හැඳින්වීම

## 01 කො අයං අභිධම්මො නාම? (මේ අභිධර්මය යනු කුමක් ද?)

01 අථ ¶ ඛො ආයස්මා ආනන්දො උට්ඨායාසනා එකංසං චීවරං කත්වා ථෙරෙ භික්ඛූ වන්දිත්වා ධම්මාසනෙ නිසීදි දන්තඛචිතං බීජනිං ගහෙත්වා. අථ මහාකස්සපත්ථෙරො ආනන්දත්ථෙරං ධම්මං පුච්ඡි – "බ්‍රහ්මජාලං, ආවුසො ආනන්ද, කත්ථ භාසිත"න්ති? "අන්තරා ච, භන්තෙ, රාජගහං ¶ අන්තරා ච නාළන්දං රාජාගාරකෙ අම්බලට්ඨිකාය"න්ති. "කං ආරබ්භා"ති? "සුප්පියඤ්ච පරිබ්බාජකං, බ්‍රහ්මදත්තඤ්ච මාණව"න්ති. "කිස්මිං වත්ථුස්මි"න්ති? "වණ්ණාවණ්ණෙ"ති. අථ ඛො ¶ ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං බ්‍රහ්මජාලස්ස නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි, වත්ථුම්පි පුච්ඡි. "සාමඤ්ඤඵලං පනාවුසො ආනන්ද, කත්ථ භාසිත"න්ති? 'රාජගහෙ, භන්තෙ, ජීවකම්බවනෙ"ති. "කෙන සද්ධි"න්ති? "අජාතසත්තුනා වෙදෙහිපුත්තෙන සද්ධි"න්ති. අථ ඛො ආයස්මා මහාකස්සපො ආයස්මන්තං ආනන්දං සාමඤ්ඤඵලස්ස නිදානම්පි පුච්ඡි, පුග්ගලම්පි පුච්ඡි. එතෙනෙව උපායෙන පඤ්ච නිකායෙ පුච්ඡි.

පඤ්චනිකායා නාම – දීඝනිකායො, මජ්ඣිමනිකායො, සංයුත්තනිකායො, අඞ්ගුත්තරනිකායො, ඛුද්දකනිකායොති. තත්ථ ඛුද්දකනිකායො නාම – චත්තාරො නිකායෙ ඨපෙත්වා, අවසෙසං බුද්ධවචනං. තත්ථ විනයො ආයස්මතා උපාලිත්ථෙරෙන විස්සජ්ජිතො, සෙසඛුද්දකනිකායො චත්තාරො ච නිකායා ආනන්දත්ථෙරෙන. තදෙතං සබ්බම්පි බුද්ධවචනං රසවසෙන එකවිධං, ධම්මවිනයවසෙන දුවිධං, පඨමමජ්ඣිමපච්ඡිමවසෙන තිවිධං; තථා පිටකවසෙන, නිකායවසෙන පඤ්චවිධං, අඞ්ගවසෙන නවවිධං, ධම්මක්ඛන්ධවසෙන චතුරාසීතිසහස්සවිධන්ති වෙදිතබ්බං.

කථං රසවසෙන එකවිධං? යඤ්හි භගවතා අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුජ්ඣිත්වා යාව අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායති, එත්ථන්තරෙ පඤ්චචත්තාලීසවස්සානි දෙවමනුස්සනාගයක්ඛාදයො අනුසාසන්තෙන පච්චවෙක්ඛන්තෙන වා වුත්තං, සබ්බං තං එකරසං විමුත්තිරසමෙව හොති. එවං රසවසෙන එකවිධං. (විනයට්ඨකථා)

02 තත්ථ ¶ කෙනට්ඨෙන අභිධම්මො? ධම්මාතිරෙකධම්මවිසෙසට්ඨෙන. අතිරෙකවිසෙසත්ථදීපකො හෙත්ථ 'අභි'-සද්දො. "බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති" (ම· නි· 3.384; සං· නි· 5.195) "අභික්කන්තවණ්ණා"තිආදීසු (සං· නි· 1.1-2) විය. තස්මා යථා සමුස්සිතෙසු බහූසු ඡත්තෙසු චෙව ධජෙසු ච යං අතිරෙකප්පමාණං විසෙසවණ්ණසණ්ඨානඤ්ච ඡත්තං, තං 'අතිච්ඡත්ත'න්ති වුච්චති, යො අතිරෙකප්පමාණො නානාවිරාගවණ්ණවිසෙසසම්පන්නො ච ධජො සො 'අතිධජො'ති වුච්චති, යථා ච එකතො සන්නිපතිතෙසු බහූසු රාජකුමාරෙසු චෙව දෙවෙසු ච යො ජාතිභොගයසඉස්සරියාදිසම්පත්තීහි අතිරෙකතරො චෙව විසෙසවන්තතරො ච රාජකුමාරො සො 'අතිරාජකුමාරො'ති වුච්චති, යො ආයුවණ්ණඉස්සරියයසසම්පත්තිආදීහි අතිරෙකතරො චෙව විසෙසවන්තතරො ච දෙවො සො 'අතිදෙවො'ති වුච්චති, තථාරූපො

බ්‍රහ්මාපි 'අතිබ්‍රහ්මා'ති වුච්චති, එවමෙව අයම්පි ධම්මො ධම්මාතිරෙකධම්මවිසෙසට්ඨෙන 'අභිධම්මො'ති වුච්චති.

සුත්තන්තඤ්හි පත්වා පඤ්චක්ඛන්ධා එකදෙසෙනෙව විභත්තා, න නිප්පදෙසෙන; අභිධම්මං පත්වා පන සුත්තන්තභාජනීයඅභිධම්මභාජනීයපඤ්හපුච්ඡකනයානං වසෙන නිප්පදෙසතො විභත්තා. තථා ද්වාදසායතනානි, අට්ඨාරස ධාතුයො, චත්තාරි සච්චානි, බාවීසතින්ද්‍රියානි, ද්වාදසපදිකො පච්චයාකාරො. (අත්ථසාලිනී)

## 02 පටිපත්තියා ච පටිවෙධස්ස ච පරියත්තියා උපකාරභාවො

### 01 සොතානුගතසුත්තං

''සොතානුගතානං, භික්ඛවෙ, ධම්මානං, වචසා පරිචිතානං, මනසානුපෙක්ඛිතානං, දිට්ඨියා සුප්පටිවිද්ධානං චත්තාරො ආනිසංසා පාටිකඞ්ඛා. කතමෙ චත්තාරො? ඉධ, භික්ඛවෙ, භික්ඛු ධම්මං පරියාපුණාති – සුත්තං, ගෙය්‍යං, වෙය්‍යාකරණං, ගාථං, උදානං, ඉතිවුත්තකං, ජාතකං, අබ්භුතධම්මං, වෙදල්ලං. තස්ස තෙ ධම්මා සොතානුගතා හොන්ති, වචසා පරිචිතා, මනසානුපෙක්ඛිතා, දිට්ඨියා සුප්පටිවිද්ධා. සො මුට්ඨස්සති [මුට්ඨස්සති (සී.)] කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ සුඛිනො ධම්මපදා ප්ලවන්ති [පිලපන්ති (සී. ස්‍යා. කං. පී.)]. දන්ධො, භික්ඛවෙ, සතුප්පාදො; අථ සො සත්තො ඛිප්පංයෙව විසෙසගාමී හොති. සොතානුගතානං, භික්ඛවෙ, ධම්මානං, වචසා පරිචිතානං, මනසානුපෙක්ඛිතානං, දිට්ඨියා සුප්පටිවිද්ධානං අයං පඨමො ආනිසංසො පාටිකඞ්ඛො.

................. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ න හෙව ඛො සුඛිනො ධම්මපදා ප්ලවන්ති; අපි ච ඛො භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. තස්ස එවං හොති – 'අයං වා සො ධම්මවිනයො, යත්ථාහං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරි'න්ති. දන්ධො, භික්ඛවෙ, සතුප්පාදො; අථ සො සත්තො ඛිප්පමෙව විසෙසගාමී හොති. සෙය්‍යථාපි, භික්ඛවෙ, පුරිසො කුසලො භෙරිසද්දස්ස. සො අද්ධානමග්ගප්පටිපන්නො භෙරිසද්දං සුණෙය්‍ය. තස්ස න හෙව ඛො අස්ස කඞ්ඛා වා විමති වා – 'භෙරිසද්දො නු ඛො, න නු ඛො භෙරිසද්දො'ති! අථ ඛො භෙරිසද්දොත්වෙව නිට්ඨං ගච්ඡෙය්‍ය. එවමෙවං ඛො, භික්ඛවෙ, භික්ඛු ධම්මං පරියාපුණාති – ...................

.................. සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ න හෙව ඛො සුඛිනො ධම්මපදා ප්ලවන්ති, නපි භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති; අපි ච ඛො දෙවපුත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති. තස්ස එවං හොති – 'අයං වා සො ධම්මවිනයො, යත්ථාහං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරි'න්ති. දන්ධො, භික්ඛවෙ, සතුප්පාදො; අථ සො සත්තො ඛිප්පංයෙව විසෙසගාමී හොති. සෙය්‍යථාපි, ...............

............... සො මුට්ඨස්සති කාලං කුරුමානො අඤ්ඤතරං දෙවනිකායං උපපජ්ජති. තස්ස තත්ථ න හෙව ඛො සුඛිනො ධම්මපදා ප්ලවන්ති, නපි භික්ඛු ඉද්ධිමා චෙතොවසිප්පත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති, නපි දෙවපුත්තො දෙවපරිසායං ධම්මං දෙසෙති; අපි ච ඛො ඔපපාතිකො ඔපපාතිකං සාරෙති – 'සරසි ත්වං, මාරිස, සරසි ත්වං, මාරිස, යත්ථ මයං පුබ්බෙ බ්‍රහ්මචරියං අචරිම්හා'ති. සො එවමාහ – 'සරාමි, මාරිස, සරාමි, මාරිසා'ති. දන්ධො, භික්ඛවෙ, සතුප්පාදො; අථ සො සත්තො ඛිප්පංයෙව විසෙසගාමී හොති. .................. (පාළි)

පඤ්චමස්ස පඨමෙ සොතානුගතානන්ති පසාදසොතං ඔදහිත්වා ඤාණසොතෙන වවත්ථපිතානං. **චත්තාරො ආනිසංසා පාටිකඞ්ඛාති** චත්තාරො ගුණානිසංසා පාටිකඞ්ඛිතබ්බා. ඉදං පන භගවතා අත්ථුප්පත්තිවසෙන ආරද්ධං. කතරඅත්ථුප්පත්තිවසෙනාති? භික්ඛූනං ධම්මස්සවනාය අනුපසඞ්කමනඅත්ථුප්පත්තිවසෙන. පඤ්චසතා කිර බ්‍රාහ්මණපබ්බජිතා ''සම්මාසම්බුද්ධො ලිඞ්ගවචනවිභත්තිපදබ්‍යඤ්ජනාදීහි කථෙන්තො අම්හෙහි ඤාතමෙව කථෙස්සති, අඤ්ඤාතං කිං කථෙස්සතී''ති ධම්මස්සවනත්ථං න ගච්ඡන්ති. සත්ථා තං පවත්තිං සුත්වා තෙ පක්කොසාපෙත්වා ''කස්මා එවං කරොථ, සක්කච්චං ධම්මං සුණාථ, සක්කච්චං ධම්මං සුණන්තානඤ්ච සජ්ඣායන්තානඤ්ච ඉමෙ එත්තකා ආනිසංසා''ති දස්සෙන්තො ඉමං දෙසනං ආරභි. (අට්ඨකථා)

02 භයෙ වූපසන්තෙ සත්තසතා භික්ඛූ අත්තනො ගතට්ඨානෙ සාට්ඨකථෙ තෙපිටකෙ එකක්ඛරම්පි එකබ්‍යඤ්ජනම්පි අනාසෙත්වා ඉමමෙව දීපමාගම්ම කල්ලගාමජනපදෙ මණ්ඩලාරාමවිහාරං පවිසිංසු. ථෙරානං ආගමනප්පවත්තිං සුත්වා ඉමස්මිං දීපෙ ඔහීනා සට්ඨි භික්ඛූ ''ථෙරෙ පස්සිස්සාමා''ති ගන්ත්වා ථෙරෙහි සද්ධිං තෙපිටකං සොධෙන්තා එකක්ඛරම්පි එකබ්‍යඤ්ජනම්පි අසමෙන්තං නාම න පස්සිංසු. තස්මිං ඨානෙ ථෙරානං අයං කථා උදපාදි ''පරියත්ති නු ඛො සාසනස්ස මූලං, උදාහු පටිපත්ති''ති. පංසුකූලිකත්ථෙරා ''පටිපත්තිමූල''න්ති ආහංසු, ධම්මකථිකා ''පරියත්තී''ති. අථ නෙ ථෙරා ''තුම්හාකං ද්වින්නම්පි ජනානං වචනමත්තෙනෙව න කරොම, ජිනභාසිතං සුත්තං ආහරථා''ති ආහංසු. සුත්තං ආහරිතුං න භාරොති ''ඉමෙ ච, සුභද්ද, භික්ඛූ සම්මා විහරෙය්‍යුං, අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්සාති (දී. නි. 2.214). පටිපත්තිමූලකං, මහාරාජ, සත්ථුසාසනං පටිපත්තිසාරකං. පටිපත්තියා ධරන්තාය තිට්ඨතී''ති (මි. ප. 4.1.7) සුත්තං ආහරිංසු. ඉමං සුත්තං සුත්වා ධම්මකථිකා අත්තනො වාදඨපනත්ථාය ඉමං සුත්තං ආහරිංසු –

> ''යාව තිට්ඨන්ති සුත්තන්තා, විනයො යාව දිප්පති;
> තාව දක්ඛන්ති ආලොකං, සූරියෙ අබ්භුට්ඨිතෙ යථා.
>
> ''සුත්තන්තෙසු අසන්තෙසු, පමුට්ඨෙ විනයම්හි ච;
> තමො භවිස්සති ලොකෙ, සූරියෙ අත්ථඞ්ගතෙ යථා.
>
> ''සුත්තන්තෙ රක්ඛිතෙ සන්තෙ, පටිපත්ති හොති රක්ඛිතා;
> පටිපත්තියං ඨිතො ධීරො, යොගක්ඛෙමා න ධංසතී''ති.

ඉමස්මිං සුත්තෙ ආහටෙ පංසුකූලිකත්ථෙරා තුණ්හී අහෙසුං, ධම්මකථිකත්ථෙරානංයෙව වචනං පුරතො අහොසි. යථා හි ගවසතස්ස වා ගවසහස්සස්ස වා අන්තරෙ පවෙණිපාලිකාය ධෙනුයා අසති සො වංසො සා පවෙණි න ඝටීයති, එවමෙවං ආරද්ධවිපස්සකානං භික්ඛූනං සතෙපි සහස්සෙපි සංවිජ්ජමානෙ පරියත්තියා අසති අරියමග්ගපටිවෙධො නාම න හොති. යථා ච නිධිකුම්භියා ජානනත්ථාය පාසාණපිට්ඨෙ අක්ඛරෙසු ඨපිතෙසු යාව අක්ඛරානි ධරන්ති, තාව නිධිකුම්භි නට්ඨා නාම න හොති. එවමෙවං පරියත්තියා ධරමානාය සාසනං අන්තරහිතං නාම න හොතීති. (අඞ්ගුත්තර-අට්ඨකථා)

03

66 අථ ඛො ආයස්මා උපාලි, උට්ඨායාසනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා යෙන භගවා තෙනඤ්ජලිං පණාමෙත්වා භගවන්තං ගාථාය අජ්ඣභාසි:-

66. ඉක්බිති ආයුෂ්මත් උපාලි ස්ථවිරයන් වහන්සේ හුනස්නෙන් නැගිට උතුරුසඟසිවුර එකස් කොට භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි කොට භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙසේ කීහ:

67. “සඞ්ඝස්ස කිච්චෙසු ච මන්තණාසු ච අත්ථෙසු ජාතෙසු විනිච්ඡයෙසු ච, කථම්පකාරොධ නරො මහත්ථිකො භික්ඛු කථං හොතිධ පග්ගහාරහො”ති.

67. “සඞ්ඝයාගේ කර්තව්‍යයන්හි ද විනයමන්ත්‍රණයන්හි ද උපන් විනයාර්ථයන්හි ද ඒ අර්ථයන් විනිශ්චය කිරීම්හි ද මහත් උපකාර ඇත්තා වූ මිනිස් තෙමේ මේ ශාසනයෙහි කෙබඳු වේ ද? මේ ශාසනයෙහි අනුබල දීමට සුදුසු වූ මහණ තෙමේ කෙබඳු වේ ද?”

68. “අනානුවජ්ජො1 පඨමෙන සීලතො අවෙක්ඛිතාචාරො සුසංවුතින්ද්‍රියො, පච්චත්ථිකා නොපවදෙන්ති2 ධම්මතො න හිස්ස තං හොති වදෙය්‍යු යෙන නං.

68. “පළමු කොට සීලයෙන් උපවාද රහිත වූයේ ‘ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති’ යනාදීන් බලාපොරොත්තු වන හැසිරීම් ඇත්තේ මනා කොට හික්මවූ ඉඳුරන් ඇත්තේ වේ ද, ඔහුට පසමිතුරෝ කරුණු වශයෙන් චෝදනා නො කෙරෙත් (දොස් නො කියත්). යම් හෙයකින් ඔහුට කියන්නාහු ද ඔහුට ඒ චෝදනාව නැත්තේ ය.

69. සො තාදිසො සීලවිසුද්ධියා ඨිතො විසාරදො හොති විසය්හ භාසති, නච්ඡම්භති පරිසගතො

69. එබඳු වූ ශීලවිශුද්ධියෙහි පිහිටියා වූ හෙතෙමේ විශාරද වෙයි. අභිභවනය කොට කියයි. පිරිස් මැදට ගියේ තැති නො ගණියි.

න වෙධති අත්‍ථං න හාපෙති අනුයයුතං භණං.

නො සැලෙයි. අනුදන්නා ලද්දක් කරුණු සහිත ව කියන්නේ අර්ථය නො නසයි.

70. තථෙව පඤ්හං පරිසාසු පුච්ඡිතො න චෙව පජ්ඣායති න මඞ්කු හොති, සො කාලාගතං3 ඛ්‍යාකරණාරහං වචො රඤ්ජෙති විඤ්ඤූපරිසං විචක්ඛණො.

70. එපරිද්දෙන් ම පිරිස් මැද පුළුවුස්නා ලද්දේ සිතිවිලි නො සිතයි. තෙදරහිත නො වේ. මකු නො වේ. කිය යුතු කල්හි පැමිණියා වූ අර්ථානුලෝම වූ ව්‍යාකරණයට සුදුසු වූ වචන කියන්නා වූ ඒ නුවණැත්තේ නුවණැති පිරිස සතුටු කෙරෙයි.

71. සගාරවො වුඩ්ඪතරෙසු භික්ඛුසු ආචෙරකම්හි ච සකෙ විසාරදො, අලං පමෙතුං පගුණො කථෙතවෙ පච්චත්‍ථිකානඤ්ච විසඞ්ධිකොවිදො4.

71. වැඩි මහලු මහණුන් කෙරෙහි ගෞරව සහිත වූයේ වාසය කරයි. ස්වකීය ආචාර්‍ය්‍යවාදයෙහි විශාරද වේ. ඒ ඒ කරුණු නුවණින් ප්‍රමාණ කරන්ට (විනිශ්චය කරන්ට) සමර්ථ වේ. කිය යුත්තෙහි කළ පරිචය ඇත්තේ වේ. පසමිතුරන් වැරදවූ තැන් දැක්මෙහි දක්‍ෂ වේ.

(කොසම්බක්ඛන්ධක)

## 03 තස්ස අභිධම්මස්ස උග්ගහනෙ කිං පයොජනං?

### අත්තනො උපකාරතා

බුදු දහමේ දැක්වෙන උත්තමාර්ථය වන නිවන සාක්ෂාත් කිරීම පිණිස සංඛත පරමාර්ථ ධර්ම (නාමරූප) අනිත්‍යාදී වශයෙන් අවබෝධ කරමින් විපස්සනා කළ යුතුය. ඒ බව මෙසේ දැක්වේ.

01 “අතීතං නාන්වාගමෙය්‍ය, නප්පටිකඞ්ඛෙ අනාගතං;
යදතීතං පහීනං තං, අප්පත්තඤ්ච අනාගතං.
“**පච්චුප්පන්නඤ්ච යො ධම්මං**, තත්‍ථ තත්‍ථ විපස්සති;
අසංහීරං අසංකුප්පං, තං විද්වා මනුබ්‍රූහයෙ. (භද්දෙකරත්තසුත්තං)

“සබ්බසො නාමරූපස්මිං, යස්ස නත්‍ථි මමායිතං;
අසතා ච න සොචති, ස වෙ භික්ඛූති වුච්චතී”ති.

තත්‍ථ **සබ්බසොති සබ්බස්මිම්පි වෙදනාදීනං චතුන්නං, රූපක්ඛන්ධස්ස චාති පඤ්චන්නං ඛන්ධානං වසෙන පවත්තෙ නාමරූපෙ.** **මමායිතන්ති** යස්ස අහන්ති වා මමන්ති වා ගාහො නත්‍ථි. **අසතා ච න සොචතීති** තස්මිඤ්ච නාමරූපෙ ඛයවයං පත්තෙ “මම රූපං

ඛීණං…පෙ… මම විඤ්ඤාණං ඛීණ’’න්ති න සොචති න විහඤ්ඤති, ‘‘ඛයවයධම්මං මෙ ඛීණ’’න්ති පස්සති. ස චෙති සො එවරූපො විජ්ජමානෙපි නාමරූපෙ මමායිතරහිතොපි අසතාපි තෙන අසොචන්තො භික්ඛූති වුච්චතීති අත්ථො. (ධම්මපදට්ඨකථා)

02 ‘‘යං පුබ්බෙ තං විසොසෙහි, පච්ඡා තෙ මාහු කිඤ්චනං;
මජ්ඣෙ චෙ නො ගහෙස්සසි, උපසන්තො චරිස්සසි.

(සුත්තනිපාත / ධම්මපදට්ඨකථා සන්තති අමච්චවත්ථු)

තවද මෙම සංස්කාර ධර්ම, නාමරූප - ස්කන්ධ සූවිසි ප්‍රත්‍යය ලෙස - ධාතු - ආයතන - වෙන්කර බලමින් විපස්සනා කළ යුතු බව මෙසේ දැක්වේ.

01 අපි ච ඛන්ධායතනධාතුපච්චයපච්චවෙක්ඛණවසෙන පෙතං වෙදිතබ්බං. එත්ථ හි චක්ඛු චෙව රූපා ච රූපක්ඛන්ධො, දස්සනං විඤ්ඤාණක්ඛන්ධො, තංසම්පයුත්තා වෙදනා වෙදනාක්ඛන්ධො, සඤ්ඤා සඤ්ඤාක්ඛන්ධො, ඵස්සාදිකා සඞ්ඛාරක්ඛන්ධො. එවමෙතෙසං පඤ්චන්නං ඛන්ධානං සමවායෙ ආලොකනවිලොකනං පඤ්ඤායති. තත්ථ කො එකො ආලොකෙති, කො විලොකෙති?

තථා චක්ඛු චක්ඛායතනං, රූපං රූපායතනං, දස්සනං මනායතනං, වෙදනාදයො සම්පයුත්තධම්මා ධම්මායතනං. එවමෙතෙසං චතුන්නං ආයතනානං සමවායෙ ආලොකනවිලොකනං පඤ්ඤායති. තත්ථ කො එකො ආලොකෙති, කො විලොකෙති?

තථා චක්ඛු චක්ඛුධාතු, රූපං රූපධාතු, දස්සනං චක්ඛුවිඤ්ඤාණධාතු, තංසම්පයුත්තා වෙදනාදයො ධම්මා ධම්මධාතු. එවමෙතාසං චතුන්නං ධාතූනං සමවායෙ ආලොකනවිලොකනං පඤ්ඤායති. තත්ථ කො එකො ආලොකෙති, කො විලොකෙති?

තථා චක්ඛු නිස්සයපච්චයො, රූපා ආරම්මණපච්චයො, ආවජ්ජනං අනන්තරසමනන්තරූපනිස්සයනත්ථිවිගතපච්චයො, ආලොකො උපනිස්සයපච්චයො, වෙදනාදයො සහජාතපච්චයො. එවමෙතෙසං පච්චයානං සමවායෙ ආලොකනවිලොකනං පඤ්ඤායති. තත්ථ කො එකො ආලොකෙති, කො විලොකෙතීති? එවමෙත්ථ ඛන්ධායතනධාතුපච්චයපච්චවෙක්ඛණවසෙනපි අසම්මොහසම්පජඤ්ඤං වෙදිතබ්බං. (දීඝනිකාය - සාමඤ්ඤඵලසුත්තවණ්ණනා)

# විශුද්ධි ඤාණාදී සංදර්ශන

## සප්ත විශුද්ධිය

- සීල - 1. සීල විශුද්ධිය :- රක්නා සීලයාගේ පිරිසිදු බව → මූලිකවම විනය පිටකයෙන්
- සමාධි -2. චිත්ත විශුද්ධිය :- උපචාර හෝ අර්පණා සමාධිය → මූලිකවම සූත්‍ර පිටකයෙන්
- ප්‍රඥා - 3. දිට්ඨි විශුද්ධිය
  4. කඞ්ඛාවිතරණ විශුද්ධිය
  5. මග්ගාමග්ග ඤාණ දස්සන විශුද්ධිය
  6. පටිපදා ඤාණ දස්සන විශුද්ධිය
  7. ඤාණ දස්සන විශුද්ධිය

## සෝළස විපස්සනා ඤාණ

:- 1. නාමරූප පරිච්ඡේද ඤාණය
:- 2. ප්‍රත්‍යය පරිග්‍රහ ඤාණය
:- 3. සම්මසන ඤාණය
:- 4. උදයවය ඤාණය → තීරණ පරිඥා
:- 5. භංග ඤාණය
:- 6. භයතුපට්ඨාන ඤාණය
:- 7. ආදීනව ඤාණය
:- 8. නිබ්බිදා ඤාණය
:- 9. මුඤ්චිතුකම්‍යතා ඤාණය
:- 10. පටිසංඛානුපස්සනා ඤාණය
:- 11. සංඛාරුපෙක්ඛා ඤාණය
:- 12. අනුලෝම ඤාණය
:- 13. ගෝත්‍රභූ ඤාණය
:- 14. මාර්ග ඤාණය
:- 15. ඵල ඤාණය
:- 16. පච්චවෙක්ඛණ ඤාණය


- 1 – 3 : ඤාත පරිඥා
- 4 : තීරණ පරිඥා
- 5 – 13 : පහාණ පරිඥා

- ✹ නවමහා විපස්සනා ඤාණ (4 – 12)
- ✹ දසමහා විපස්සනා ඤාණ (3 – 12)

→ මූලිකවම අභිධර්ම පිටකයෙන්

# අනාපාන හා ධාතු කර්මස්ථාන තුළින් නිවණ අවබෝධ කිරීම

(විස්තර පහළ සිට)




භික්ෂූන් වහන්සේලාට චතු පාරිශුද්ධ සීලයත්, ගිහි අයට පංච සීලයේ පටන් ගහට්ඨ දස සීලය තෙක් සීලයෙන් පිරිසිදු වීමයි.

02 කථං **භාවෙතබ්බාති** එත්ථ පන යස්මා ඉමාය පඤ්ඤාය ඛන්ධායතනධාතුඉන්ද්‍රියසච්චපටිච්චසමුප්පාදාදිභෙදා ධම්මා **භූමි**. සීලවිසුද්ධි චෙව චිත්තවිසුද්ධි චාති ඉමා ද්වෙ විසුද්ධියො **මූලං**. දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි, පටිපදාඤාණදස්සනවිසුද්ධි, ඤාණදස්සනවිසුද්ධීති ඉමා පඤ්ච විසුද්ධියො **සරීරං**. තස්මා තෙසු භූමිභූතෙසු ධම්මෙසු උග්ගහපරිපුච්ඡාවසෙන ඤාණපරිචයං කත්වා මූලභූතා ද්වෙ විසුද්ධියො සම්පාදෙත්වා සරීරභූතා පඤ්ච විසුද්ධියො සම්පාදෙන්තෙන භාවෙතබ්බා. අයමෙත්ථ සඞ්ඛෙපො. (විසුද්ධිමග්ග ඛන්ධනිද්දෙස)

03 යං පන වුත්තං ''දිට්ඨිවිසුද්ධි, කඞ්ඛාවිතරණවිසුද්ධි, මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි, පටිපදාඤාණදස්සනවිසුද්ධි, ඤාණදස්සනවිසුද්ධීති ඉමා පන පඤ්ච විසුද්ධියො සරීර''න්ති, තත්ථ නාමරූපානං යාථාවදස්සනං දිට්ඨිවිසුද්ධි නාම.

**663**. තං සම්පාදෙතුකාමෙන **සමථයානිකෙන** තාව ඨපෙත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං අවසෙසරූපාරූපාවචරජ්ඣානානං අඤ්ඤතරතො වුට්ඨාය විතක්කාදීනි ඣානඞ්ගානි, තංසම්පයුත්තා ච ධම්මා **ලක්ඛණරසාදිවසෙන** පරිග්ගහෙතබ්බා. පරිග්ගහෙත්වා සබ්බම්පෙතං ආරම්මණාභිමුඛං නමනතො නමනට්ඨෙන **නාමන්ති** වවත්ථපෙතබ්බං.

තතො යථා නාම පුරිසො අන්තොගෙහෙ සප්පං දිස්වා තං අනුබන්ධමානො තස්ස ආසයං පස්සති, එවමෙව අයම්පි යොගාවචරො තං නාමං උපපරික්ඛන්තො ''ඉදං නාමං කිං නිස්සාය පවත්තතී''ති පරියෙසමානො තස්ස නිස්සයං හදයරූපං පස්සති. තතො හදයරූපස්ස නිස්සයභූතානි, භූතනිස්සිතානි ච සෙසුපාදායරූපානීති රූපං පරිග්ගණ්හාති. සො සබ්බම්පෙතං රුප්පනතො **රූපන්ති** වවත්ථපෙති. තතො නමනලක්ඛණං නාමං, රුප්පනලක්ඛණං රූපන්ති **සඞ්ඛෙපතො නාමරූපං** වවත්ථපෙති.

**664**. **සුද්ධවිපස්සනායානිකො** පන අයමෙව වා **සමථයානිකො** චතුධාතුවවත්ථානෙ වුත්තානං තෙසං තෙසං ධාතුපරිග්ගහමුඛානං අඤ්ඤතරමුඛවසෙන සඞ්ඛෙපතො වා විත්ථාරතො වා චතස්සො ධාතුයො පරිග්ගණ්හාති. අථස්ස යාථාවසරසලක්ඛණතො ආවිභූතාසු ධාතූසු කම්මසමුට්ඨානම්හි තාව කෙසෙ ''චතස්සො ධාතුයො, වණ්ණො, ගන්ධො, රසො, ඔජා, ජීවිතං, කායප්පසාදො''ති එවං කායදසකවසෙන දස රූපානි, තත්ථෙව භාවස්ස අත්ථිතාය භාවදසකවසෙන දස, තත්ථෙව ආහාරසමුට්ඨානං ඔජට්ඨමකං, උතුසමුට්ඨානං, චිත්තසමුට්ඨානන්ති අපරානිපි චතුවීසතීති එවං චතුසමුට්ඨානෙසු චතුවීසතිකොට්ඨාසෙසු චතුචත්තාලීස චතුචත්තාලීස රූපානි, සෙදො, අස්සු, ඛෙළො, සිඞ්ඝාණිකාති ඉමෙසු පන චතූසු උතුචිත්තසමුට්ඨානෙසු ද්වින්නං ඔජට්ඨමකානං වසෙන සොළස සොළස රූපානි, උදරියං, කරීසං, පුබ්බො, මුත්තන්ති ඉමෙසු චතූසු උතුසමුට්ඨානෙසු උතුසමුට්ඨානස්සෙව ඔජට්ඨමකස්ස වසෙන අට්ඨ අට්ඨ රූපානි පාකටානි හොන්තීති. එස තාව **ද්වත්තිංසාකාරෙ** නයො. (විසුද්ධිමග්ග දිට්ඨිවිසුද්ධිනිද්දෙස)

එසේ නාමරූප ධර්ම, ස්කන්ධ - ආයතන - ධාතු - සූවිසි ප්‍රත්‍යය ලෙස වෙන්කර බැලීමට අභිධර්ම දැනීම අත්‍යාවශ්‍ය වේ.

**පරෙසං ච සාසනස්ස ච උපකාරතා**

''අපරෙහිපි, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො. න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා අභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියකාය සික්ඛාය විනෙතුං, **අභිධම්මෙ විනෙතුං**, අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං – ඉමෙහි ඛො, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

''පඤ්චහි, භික්ඛවෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං, නිස්සයො දාතබ්බො, සාමණෙරො උපට්ඨාපෙතබ්බො. **පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා** අභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියකාය සික්ඛාය විනෙතුං, **අභිධම්මෙ විනෙතුං,** අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං – ඉමෙහි ඛො, භික්ඛවෙ, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං, නිස්සයො දාතබ්බො, සාමණෙරො උපට්ඨාපෙතබ්බො. (විනය මහාවග්ගපාළි)

**අභිධම්මෙති** නාමරූපපරිච්ඡෙදෙ විනෙතුං න පටිබලොති අත්ථො. **අභිවිනයෙති** සකලෙ විනයපිටකෙ විනෙතුං න පටිබලොති අත්ථො. **විනෙතුං න පටිබලොති** ච සබ්බත්ථ සික්ඛාපෙතුං න සක්කොතීති අත්ථො. (විනයට්ඨකථා)

**නාමරූපපරිච්ඡෙදෙති** එත්ථ කුසලත්තිකාදීහි වුත්තං ජාතිභූමිපුග්ගලසම්පයොගවත්ථාරම්මණකම්මද්වාරලක්ඛණරසාදිභෙදෙහි වෙදනාක්ඛන්ධාදිචතුබ්බිධං සනිබ්බානං නාමං, භූතුපාදායභෙදං රූපඤ්ච පරිච්ඡින්දිත්වා ජානනපඤ්ඤා, තප්පකාසකො ච ගන්ථො නාමරූපපරිච්ඡෙදො නාම ඉමිනා . අභිධම්මත්ථකුසලෙන භවිතබ්බන්ති දස්සෙති. **සික්ඛාපෙතුන්ති** උග්ගණ්හාපෙතුං. (විමතිවිනොදනීටීකා)

**අභිධම්මෙති** එත්ථ සුත්තන්තපාළිතො අභි අතිරෙකො, අභිවිසිට්ඨො වා ධම්මො අභිධම්මොති වුත්තෙ නාමරූපපරිච්ඡෙදකං අභිධම්මපිටකන්ති ආහ ''නාමරූපපරිච්ඡෙදෙ''ති.. (පාචිත්තියාදියොජනාපාළි)

## 04 තස්ස උග්ගහෙතබ්බාකාරො

01 අභිධර්මාර්ථ සංග්‍රහය හා ඊට අදාල පොත්
02 ධම්මසංගනී මාතිකා
03 ධම්මසංගනීප්පකරණය
04 සෙසු පකරණවල මාතිකා හා ඒම පකරණ පොත්.